# දැන්වීමයි

## විනයාධිකාරි ධූරය (Proctor)

ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාල ශිෂ්‍ය විනය පිළිබඳ අතුරු ව්‍යවස්ථාවේ විධිවිධාන පරිදි මෙම විශ්වවිද්‍යාලයේ විනයාධිකාරි ධූරය (Proctor) සඳහා සුදුසු ජ්‍යෙෂ්ඨ ආචාර්යවරයෙකු පත් කිරීම පිණිස මෙයින් අයදුම්පත් කැඳවනු ලැබේ.

මෙම තනතුර සඳහා විශ්වවිද්‍යාලයේ ශිෂ්‍ය උපදේශනය පිළිබඳ මනා පළපුරුද්දක් ඇති ජ්‍යෙෂ්ඨ ආචාර්යවරුන් අතරින් අයදුම්පත් කැඳවන අතර තම අයදුම්පත්‍රය සමග ස්වකීය ජීව දත්ත පිටපතක් සහ ශිෂ්‍ය උපදේශනය පිළිබඳ ලබා ඇති පළපුරුද්ද පිළිබඳ විස්තර ඉදිරිපත් කළ යුතුය.

විනයාධිකාරි ධූරය උපකුලපතිගේ විධානය හා පරිපාලනයට යටත්ව ක්‍රියාත්මක වන අතර විශ්වවිද්‍යාල ශිෂ්‍යන්ගේ විනය භාරව කටයුතු කළ යුතු වේ. මෙම ධූරය සඳහා තම මූලික වැටුපෙන් 25% ක දීමනාවක් හිමිවේ.

විනයාධිකාරි ධූරයේ බලතල කාර්ය හා කර්තව්‍යයන් 2006 අංක 01 දරන විශ්වවිද්‍යාල ශිෂ්‍ය විනය පිළිබඳ අතුරු ව්‍යවස්ථාවේ සඳහන් වේ. මෙම අතුරු ව්‍යවස්ථාවේ පිටපතක් ශිෂ්‍ය සේවා අංශයෙන් හෝ අදාළ පීඨ කාර්යාලයෙන් ලබා ගත හැකිය.

අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය 2025.10.31 දින වේ. මෙදිනට පෙර තම අයදුම්පත් පීඨාධිපති මඟින් නියෝජ්‍ය ලේඛකාධිකාරී /අධ්‍යයන ආයතන වෙත ඉදිරිපත් කරන ලෙස දන්වමි.

වැ.බ. උපකුලපති
ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය
මිහින්තලේ.

වෛද්‍ය. පී. එච්. ජී. ජේ. පුෂ්පකුමාර
වැඩබලන උපකුලපති
2025.10.02